# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2471/70 – 2026 ජනවාරි මස 17 වැනි සෙනසුරාදා – 2026.01.17**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය**

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි.

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, කරෙයිනගර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක J/40, කරෙයිනගර් බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කරෙයිනගර් ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක YA/KRN/2022/102 හා 2023.11.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර ‘A’ – කුඩ්ඩිරාපත්තායි – ප්‍රමාණය: හෙක්. 0.1826

උතුරට: ක්‍රීඩාපිටිය, හිමිකරු නොදන්නා; නැගෙනහිරට: වීදිය; දකුණට: කන්ඩයියා තවමලර් හිමිකම් කියන සින්නලේඩි; බටහිරට: ඇළ (වියළි) සහ විජයකලා මහේස්වරන් හිමිකම් කියන සින්නලේඩි.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

*මගේ අංකය*: 4-3/9/2021/PC/393.
2025 නොවැම්බර් මස 21 වැනි දින.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
1200/6, ‘‘මිහිකත මැදුර’’,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 01 – 0177


1A – G 046121 – 13 (2026/01)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*